---

**මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2011 ජුලි 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1:2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1:3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

**අනුකූල නොවීම්**

විගණනයේදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති , රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 2.14.1 | සීල් තබන ලද මිල කැඳවීම් 5 ක් ලබානොගෙන වෙළඳ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.94,959 ක් ගෙවා තිබුණි. |
| (ආ) | 2006 අංක 12 දරන මුද්දර බදු පනත | පාරිශ්‍රමික වලින් රු.300 ක මුදලක් අඩුකර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | අංක 12/2000 (3) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව පරිගණක පුහුණුවන්නකු සඳහා මාසික දීමනාවක් ලෙස රු.18,450 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.159,097 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවරතන වියදම රු.14,890,278 ක් විය.

### 2:2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම, හිඟ ආදායම

සභාපති විසින් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | - | - | - | 50 | 50 | - |
| (ii) | බදු කුලී | 104 | 104 | - | 142 | 142 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 162 | 162 | - | 819 | 819 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,757 | 1,757 | - | 3,466 | 3,466 | - |

### 2:3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත වියදම, තථ්‍ය වියදම හා විචලනය පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| **වියදම් විෂයය** | **ඇස්තමේන්තුගත** | **තථ්‍ය** | **විචලනය** | **ඇස්තමේන්තුගත** | **තථ්‍ය** | **විචලනය** |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පුද්ගලික පඩිනඩි | 7,727 | 6,222 | 1,505 | 5,287 | 5,981 | (694) |
| වෙනත් | 6,519 | 5,294 | 1,225 | 1,458 | 20,194 | (18,736) |
| උප එකතුව | 14,246 | 11,516 | 2,730 | 6,745 | 26,175 | (19,430) |
| මූලධන වියදම | 34,338 | 12,391 | 21,947 | 1,700 | 4,491 | (2,791) |
| මුළු එකතුව | 48,584 | 23,907 | 24,677 | 8,445 | 30,666 | (22,221) |

## 2:4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | 2010 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | අනුමත | තථ්‍ය |
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | 01 |
| ද්විතීය ශ්‍රේණිය | 10 | 09 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 06 | 06 |
| වෙනත් ( අනියම් / තාවකාලික ) | - | 15 |
| | 17 | 31 |

2:5 **වත්කම් කළමනාකරණය**

**සමීක්ෂණය නොකළ වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු කර නොගෙන පොත්වල දැක්වෙන ශේෂය මත ගණනය කරන ලද වත්කම්වල වටිනාකම රු.23,635,075 ක් විය.

2:6 **අභ්‍යන්තර විගණනය**

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) ආදායම් පරිපාලනය